# මීමැස්සාගේ සතුරෝ

## ජනපදයකට ආරක්ෂාව සලසන සැටි

**උසස් පෙළට කෘෂි විද්‍යා දැනුම**

විනීතා විජයරත්න (බී. ඇස්. සී. කෘෂිකර්ම ගෞරව) විසිනි

(1979 දෙසැම්බර් කලාපය හා සම්බන්ධයි.)

**මී මැසි පාලනයේදී වැදගත්වන කරුණු**

**1 පලිබෝධයන්ගෙන් ආරක්ෂා කිරීම**

(අ) **ඉටි සලබයා** මී මැස්සන්ට හානි පමුණුවන්නන් අතරින් ප්‍රධාන තැනක් ගන්නේ මෙම පලිබෝධයායි. මොවුන් ආකාර දෙකකි.

1 විශාල ඉටි සලබයා

2 කුඩා ඉටි සලබයා

වැඩුණු සලබයා මී පෙට්ටියේ ඇති සිදුරු තුළ බිත්තර දමයි. කීටයා මුලින් යට ලෑල්ල මත ඇති කුණු රොඩු ආහාරයට ගනී. පසුව වදකරා පැමිණේ. එවිට මී මැසි බිත්තර, පරණ පිළා කෝෂ, පරාග හා ඉටි මත යැපේ. මොවුන් වියන සේද දැලක් වැන්නකින් මී වදය වසා දැමීම නිසා මී මැස්සන්ට වදය තුළ ජීවත්වීම අපහසුවේ. මෙ නිසා මී මැස්සන් වදය අතහැරයාම සිදුවිය හැක. මොවුන් පෙට්ටියේ ලෑලි අතර ඇති සිදුරක් තුළ හෝ වදයෙහිම හෝ කෝෂ සාදගෙන පිළා අවධියට පත්වේ.

නිතරම ජනපදය පරීක්ෂාකර බලා, මෙම පලිබෝධයාගේ බිත්තර හෝ කීටයන් ඇත්නම් විනාශ කිරීම, ලෑලි අතර සිදුරු ඇතිවීම වැළැක්වීම ජනපදය දුර්වල අවස්ථාවලදී මී මැස්සන්ගෙන් පිරී නැති පිළා වද ඉවත් කිරීම (මී මැස්සන් අඩු වද පහසුවෙන් ආක්‍රමණය කරන නිසා) වැනි ක්‍රම අනුගමනය කිරීමෙන් මේ සලබයාගෙන් වන හානි වළක්වා ගත හැක.

**(ආ) දිමියන්, කැරපොත්තන් හා කටුස්සන්**

දිමියන් මී මැස්සන්ට වදයෙන් පිටදී හානි සිදුකරන අතර වදයට ඇතුලුවී, පිලවුන් සහ ආහාර රැගෙන යයි. කැරපොත්තන්ද පිළවුන්ට හානි කරන අතරම ආහාර රැගෙන යාම ද කරයි. කටුස්සන් පැණි හා මී මැස්සන් ආහාරයට ගනී.

(ඇ) **දෙබරුන්** වදයේ දොරටුව අසල පියාඹමින් සිට වැඩකාර මැස්සියන් අල්ලා ගනී. සමහරවිට වදයට ඇතුළුවී මැස්සන් රැගෙන යයි. මී පෙට්ටි අසල ඇති දෙබර කූඩු විනාශ කිරීම සහ දොරටුව දෙබරුන්ට ඇතුළුවීමට නොහැකිවනසේ දැලකින් වැසීම යන ක්‍රම මේ හානිය වැළැක්වීමට අනුගමනය කළ යුතුය.

(ඈ) **කුහුඹුවන්** පිළවුන් සහ මී පැණි ආහාරයට ගනී. මී මැසි පෙට්ටිය අඩි කීපයක් උස ආධාරකයක් මත තැනීමෙනුත්, ආධාරකයේ පාදය ජලයෙන් වටකිරීමෙනුත් කුහුඹුවන්ගෙන් මී මැස්සන් ආරක්ෂාකරගත හැක.

**(2) මී මැසි රෝග පාලනය**

ලංකාවේ මී මැස්සන්ට රෝග වැළදෙන බවක් තවම සොයාගෙන නැත. එහෙත් සෞම්‍ය කලාපීය මී මැස්සන්ට වැළදෙන රෝග කිහිපයකි.

i යුරෝපීය පවුල් බෲඩ් } බැක්ටීරියානු දෙවර්ගයකින් ඇතිවන මේ රෝග කීටයන්ට හා පිළවුන්ට
ii ඇමරිකානු පවුල් බෲඩ් } වැළදේ.

iii ඇකරීනා රෝගය – මී මැස්සන්ගේ ශ්වාසනාල වල හටගන්නා මෙම රෝගය කිඩැවකු නිසා ඇතිවන්නකි.

හොඳින් හිරු එළිය සහ වාතාශ්‍රය ලැබෙන තැනක මී මැසි පෙට්ටිය තැබීම, නියමිත ඉඩකඩ හා ආහාර සැපයීම ආදිය මගින් මී මැස්සන් ශක්තිමත්ව වැඩීමට සැලැස්වීම රෝග ඇතිවීම වැළැක්වීමට බෙහෙවින් ආධාරවේ.

(3) පලායෑම වැළැක්වීම

වදය තුල හෝ පිටස්ථර තත්‍වයන් අයහපත් වූ විට මුළු මී මැසි රංචුවම වදය අතහැරයෑම පලායෑම නමින් හැඳින්වේ. (මෙය සමුහසරණයට වෙනස්ය.)

පලායෑමට හේතු

i පලිබෝධ ආක්‍රමණ (විශේෂයෙන්ම ඉටි සලබයා)

ii වදය තුල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම

iii වදය තුල උෂ්ණත්වය වැඩිවීම

vi ආහාර හිඟවීම

නිතර වදය පරීක්ෂාකර බලා පලිබෝධයන් ඇතොත් විනාශ කිරීම, ආහාර හිඟ කාලවලදී පැණි බෝතල් තබා ආහාර සැපයීම හා නියමිත ලෙස ඉඩකඩ සැපයීම මගින් පලායෑම වළක්වාගත හැක.

(4) නව රැජිනක් ඇතුළු කිරීම

සෑම වසරකට හෝ දෙකකට වරක් නව රැජිනක් ඇතුලු කිරීම නවීන මී මැසි පාලනයේ වැදගත් අංගයක්ව පවතී. මල් වාරයේ මුලදී මෙය කිරීමෙන් මල් වාරයේදී මී මැස්සන් වැඩි සංඛ්‍යාවක් ලබාගත හැක. සීඝ්‍රව බිත්තර දැමීම, සමූහ සරණයට අකමැතිවීම, පහසුවෙන් පාලනය කළ හැකිවීම වැනි ලක්‍ෂණ හොඳ මාදිලියක මී මැස්සන් තුළ දැකිය හැක. මෙවැනි මාදිලියකින් ලාබාල රැජිනක් තෝරාගෙන ඇතුල් කල යුතුය. වානිජව රැජිනක් අලෙවිකරන ස්ථානයකින් මෙවැනි රැජිනක් මිලදී ගැනීම අවශ්‍ය නම් කල හැක.

(5) අහිතකර කාල වලදී සීනි ද්‍රාවණ සැපයීම

(6) පැරණි වද ඉවත් කිරීම

(7) විශේෂයෙන්ම මල් වාරයේදී සමූහ සරණය ඇතිවීම වැළැක්වීම. (මෙය පසුගිය කලාප යක විස්තරකර ඇත.)

මෙම කරුණු අනුගමනය කිරීමෙන් මී මැසි මාදිලියට හා පරිසරයට අනුව ලබාගත හැකි උපරිම මී පැණි ප්‍රමාණය ලබාගැනීමට ඔබට හැකිවනු ඇත.

මී මැසි පාලනය සඳහා අවශ්‍යවන උපකරණ කිහිපයක සටහන් සහිත තවත් කොටසක් ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.